දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය )
எனது இல ) NA/06/16/2018
My No. )

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2019.08. ２०
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල්/ මහ රෝහල් අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරීන්,
ඇතුළු සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>කුරුණෑගල සහ කෑගල්ල ශික්ෂණ රෝහල් සඳහා ස්ථාන මාරු කැඳවීම - 2018</u>**

කුරුණෑගල හා කෑගල්ල ශික්ෂණ රෝහල් සඳහා විශේෂිත ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබා දෙමින් නිකුත් කරන ලද මගේ සමාංක හා 2019.03.29 දිනැති ස්ථාන මාරු නියෝගය හා බැඳේ.

02. එම ස්ථාන මාරු නියෝගය අනුව උක්ත රෝහල් සඳහා ස්ථාන මාරු ලබා දෙන ලද නිලධාරීන් අතුරින් ස්ථාන මාරු අවලංගු කිරීමට කර ඇති ඉල්ලීම් සලකා බලා ස්ථාන මාරු අවලංගු කරන නිලධාරීන් වෙනුවට හා වැඩිවී ඇති සේවක සංඛ්‍යාවට අනුව කුරුණෑගල කෑගල්ල විශේෂිත ස්ථාන මාරු ලේඛනයේ ජ්‍යෙෂ්ඨතාවය අනුව ඊ ළඟට සිටින නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දීමට තීරණය කර ඇත.

03. ඒ අනුව ඔබ රෝහලේ සේවය කරන මේ සමඟ අමුණා ඇති ඇමුණුම 01හි නම් සඳහන් සෙද නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ගන්නා ලද තීරණ අදාල නිලධාරීන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇත. අවසන් නිර්දේශය ලෙස සඳහන් තීරුවේ "නිර්දේශ කරමු" ලෙස සඳහන් වී ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු 2019.08.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි මින් නියෝග කරමි. එසේම ස්ථාන මාරු අවලංගු කරන නිලධාරීන්ගේ නාම ලේඛනය ඇමුණුම 02 මගින් දැක්වේ.

04. ඒ අනුව අදාල නිලධාරීන් මුදා හැරීමේදී, ඔබ රෝහලේ ස්ථාන මාරු අවලංගු කරන නිලධාරීන් සඳහා දැනටමත් අනුප්‍රාප්තිකයින් ලබා දී ඇති බැවින්, එම අවලංගු කරන නිලධාරීන් සංඛ්‍යාවට සමාන නිලධාරීන් පිරිසක් ජ්‍යෙෂ්ඨතාවය අනුව උක්ත ස්ථාන මාරු නියෝග මත මුදාහරින ලෙසත්, ඉතිරි නිලධාරීන් ඉදිරයේදී ලබා දෙන කණ්ඩායමකින් අනුප්‍රාප්තිකයින් යොදාගෙන මුදා හරින ලෙසත් කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධව ඔබ ආයතනයේ සියලු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

ඒ.එම්.කේ.කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) 02
ලේකම් වෙනුවට,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

පිටපත්.
**01.** අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල කුරුණෑගල - } දැ.ගැ.ස
**02.** අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල කෑගල්ල - }